# ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan)

## දෙවන බස සිංහල - 10 ශ්‍රේණිය

(2021 වර්ෂය සඳහා 10 ශ්‍රේණිය ඉගෙනම් සැලැස්ම කාලච්ඡේද 60කින් සමන්විත වන අතර එහි මුල් කාලච්ඡේද විසිහතර, 9 ශ්‍රේණිය 2 හා 3 වාරවලට අදාළ ඉගෙනුම් පලවලින් ද ඉතිරි කාලච්ඡේද තිස්හය 10 ශ්‍රේණිය 1,2, හා 3 වාරවලට අදාළ ඉගෙනුම් පලවලින් ද සමන්විත වේ. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.)

| 10 ශ්‍රේණිය මුල් කාලච්ඡේද 24 සඳහා 9 ශ්‍රේණිය 2 සහ 3 වාරවලින් තෝරා ගත් පාඩම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | පෙළ පොතේ පාඩම | කාලච්ඡේද | වාරය |
| 9 ශ්‍රේණිය දෙවන වාරයේ ඉගෙනුම් පලවලට අදාළ තෝරා ගත් පාඩම් | | | | | | |
| 1.0<br>3.0<br>4.0 | 1.5, 3.2, 4.4 | • ගීතයට අවධානයෙන් සවන් දෙමින් තාල තබයි.<br>• ගීතය ගායනා කරමින් රස විඳියි.<br>• ළමා නාට්‍යයෙහි තේමාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ඉගෙනුම් අවස්ථාව හඳුනා ගෙන අගය කරයි.<br>• නාට්‍යයෙහි තම සිත් ගත් අවස්ථා පිළිබඳ ව ලියයි. | • **නරිබෑනා නාට්‍යය**<br>• **ඇහැළ මලින් ගස් පිරිලා .. ගීතය** | **06.** නරිබෑනා | 5 | දෙවන වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 2.0 | 2.6 | • සාකච්ඡා වන අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ඉගෙනුම් අවස්ථාවට අදාළ භාෂා භාවිත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාකච්ඡාවලට මැදිහත් වී තම අදහස් ප්‍රකාශ කරයි. | • **ලෑලි පාලම පිළිසකර කිරීම පිළිබඳ සාකච්ඡාවක්** | **07.** ලෑලි පාලම | 3 | |
| 2.0 | 2.2 | • මග විමසීම් අවස්ථාවට අදාළ වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• මග විමසීම් අවස්ථාවට අදාළ භාෂා රටා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• මග විමසීම්වලට මැදිහත් වී නිවැරදි ප්‍රතිචාර දක්වයි. | • **තල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවකට යාම සඳහා මග විමසීම** | **10.** තල් ගම්මානය | 3 | තෙවන වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 4.0 | 4.1, 4.3, 4.5 | • ඉගෙනුම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ආරාධනා පත්‍රයේ අන්තර්ගතය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ආරාධනා පත්‍ර සකස් කරයි.<br>• ලිපියේ ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සරල ලිපියක් ලියයි. | • **ලිපියක්**<br>• **ආරාධනා පත්‍ර**<br>• **ආකෘති පත්‍ර** | **13.** ආරාධනා පත්‍රයක් හදමු. | 5 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | • ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කරයි. | | | | |
| **10 ශ්‍රේණියට නියමිත ඉගෙනුම් පල සඳහා තෝරා ගත් පාඩම්** | | | | | | |
| 2.0 | 2.1 | • උපදෙස් ලබා දීමේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• දෙන ලද උපදෙස්වලට අනුව කටයුතු කරයි.<br>• උපදෙස්වලට අනුව වාචික ප්‍රතිචාර දක්වයි. | • **පාසලේ නිවාසාන්තර උත්සවයක දී නිවාසයක් ගොඩනැංවීම.** | **01.** නෙළුම් නිවාසය | 4 | පළමු වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 1.0 | 1.5 | • අදාළ ගීතයේ අදහස සරල බසින් ප්‍රකාශ කරයි.<br>• ගීතයට උචිත අයුරින් තාල තබයි.<br>• ගීතය ගායනා කරයි. (සාමූහික ව/තනි තනි ව)<br>• වෙනත් ගීත ඇසීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | • **මව්ගුණ කියවෙන ගීතයක්** | **04.** මගේ අම්මා | 4 | |
| 4.0 | 4.2 | • සිදුවීමක් ඇසුරින් නිර්මාණාත්මක වාක්‍ය කිහිපයක් ලියයි.<br>• තම අත්දැකීමක් නිර්මාණාත්මක ව ලියයි.<br>• කාල්පනික අවස්ථාවක් මාතෘකා කර ගනිමින්<br>• නිර්මාණාත්මක පාඨ ලියයි. | • **(තාත්තාට රැකියා ස්ථානයේ මාරුවක් ලැබීම) අලුත් පාසලකට යාමට සිදුවීම.** | **02.** දින පොතේ පිටුවක් | 3 | |
| 3.0 | 3.4 | • ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි.<br>• පින්තූර කතාවක එක් එක් අවස්ථාවල දැක්වෙන විස්තරය කියවයි/නරඹයි.<br>• සරල කතාවක් පිළිවෙළින් ගොඩ නගා කියවයි.<br>• රසවත් කෙටි සිද්ධි ඇතුළත් කතා කියවයි. | • **පින්තූර කතාවක් (වලහා කී රහස)** | **08.** වලහා කී රහස | 4 | දෙවන වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 2.0 | 2.5 | • ගනුදෙනුවල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• එම වචන භාවිත කරමින් ගනුදෙනුවල යෙදෙයි.<br>• විවිධ ගනුදෙනු සිදු කරයි.<br>• විවිධ ගනුදෙනුවල දී සුහද ව අදහස් ප්‍රකාශ කිරීමට මැදිහත් වෙයි. | • **ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම.** | **09.** අලි බලන්න යමු | 4 | |
| 3.0 | 3.1 | • ලිපියක් නිශ්ශබ්ද ව කියවයි.<br>• එම ලිපියේ ඇතුළත් තොරතුරු කියයි.<br>• වෙනත් ලිපි ලේඛන කියවයි. නරඹයි. | • **යහළුවකුගෙන් ලැබුණු ලිපියක්** | **11.** මිතුරෙකුගෙන් ලිපියක් | 4 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | • ඒවායේ සරල අදහස් ප්‍රකාශ කරයි. | | | | |
| 1.0 | 1.3 | • මග විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br>• මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අදාළ වචන භාවිත කරමින් මග විමසීම් කරයි.<br>• මග විමසීම් සඳහා අවශ්‍ය වන වෙනත් වචන ඉගෙනුමට කැමැත්ත ප්‍රකාශ කරයි. | • **චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීම සඳහා දුරකථනයෙන් විමසීම.** | **12.** චිත්‍ර ප්‍රදර්ශනයක් | 4 | තෙවන වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 4.0 | 4.3, 4.5 | • වෙනස්කම් සහිත විධිමත් හා අවිධිමත් සරල ලිපි ලියයි.<br>• විධිමත් ලිපි ලිවීමට හුරු වෙයි.<br>• තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලිපි ලියයි.<br>• රාජකාරිමය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ලිපි ලියයි.<br>• අයදුම්පතට අදාළ ව තොරතුරු කෙටියෙන් ඉදිරිපත් කරයි.<br>• අයදුම්පතක් පුරවයි.<br>• පාඨමාලාවක් හැදෑරීම/රැකියාවක් සඳහා අයදුම්<br>• පත්‍රයක් සම්පූර්ණ කරයි. | • **දෙවන බස සිංහල පාඨමාලාවක් කිරීමට අවස්ථාව ඉල්ලා යවන ලිපියක්** | **14.** අයදුම් පතක් පුරවමු | 3 | |
| 2.0<br>3.0<br>4.0 | 2.7, 3.2, 4.4 | • වාචික ඉදිරිපත් කිරීම්වල ස්වභාවය හඳුනා ගෙන අනුගමනය කරයි.<br>• ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වාචික ඉදිරිපත් කිරීම් කරයි.<br>• විවිධ උපකරණ/ආධාරක භාවිත කරමින් වාචික ඉදිරිපත් කිරීම් කරයි.<br>• ගීතයට අනුව තාල තබයි.<br>• ගීතය ගායනා කරයි.<br>• පින්තූර නරඹමින් ගීතයේ සරල අර්ථය ප්‍රකාශ කරයි.<br>• ගීතය තාලානුකූල ව ගායනා කරයි.<br>• තොරතුරු ඇතුළත් පාඨ හඳුනා ගෙන ලියයි.<br>• සරල මාතෘකා යටතේ තොරතුරු ඇතුළත් පාඨ ලියයි.<br>• සිත් ගත් අවස්ථාවක් පිළිබඳ තොරතුරු පාඨ ලියයි.<br>• පුවත් පතකට ලිපියක් ලියයි. | • **භාෂා ඉගෙනීමේ වැදගත්කම සහ පාඨමාලාවක් හැදෑරීමේ දී අත්වන වාසි සසඳා බලා වඩාත් සුදුසු දේ තෝරා ගැනීම.**<br>• **ජන කතාවක් හෝ ගීතයක්** | **15.** අපේ භාෂා කඳවුර | 6 | |